සියලුම හිමිකම් ඇවිරිණි.



දෙවන වාර ඇගයීම - 2016
Second Term Evaluation - 2016

7 ශ්‍රේණිය
Grade 7

සිංහල භාෂාව හා සාහිත්‍යය I හා II පත්‍රය
Sinhala Language & Literature Paper I & II

පැය දෙකයි
*Two hours*

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**

❀ **පහත වාක්‍යවල ඉරි ඇඳි පදවල අදහස දැක්වෙන පිළිතුර තෝරන්න.**

01. බන්ධනාගාරගතව සිටි ඔහුට දැනුණේ, කාලය ඉබි ගමනේ ගෙවී යන්නාක් මෙනි,
    (1) ඉබ්බෙකු මෙන් (2) වේගයෙන්
    (3) නිසොල්මනේ (4) ඉතා සෙමින්

02. උඩින් පල්ලෙන් වැඩ කළහොත් විභාගය අසමත් වන බව ගුරුතුමා සිසුන්ට පැවසුවේ ය.
    (1) කම්මැලිකමෙන් (2) නොසැලකිල්ලෙන්
    (3) උඩබිම බලමින් (4) උනන්දුවෙන්

03. පහත පදයේ ඇති පිල්ලම් නම් කරන්න.
    (1) මාතෘ - .....................................................................................

04. නූතන සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර අක්ෂර සංඛ්‍යාව
    (1) 60 කි. (2) 10 කි.
    (3) 18 කි. (4) 8 කි.

05. පහත වචනවල හිස්තැනට සුදුසු අක්ෂර යොදන්න.
    (1) සමීක්.........ණ (ශ, ෂ) (2) වෙළෙඳපො...........(ල, ළ)

06. පහත මුලින් දී ඇති පදයට සමාන පදයක් නොවන පදය තෝරන්න.
    (1) මුහුද - රුවනාර, සිඳු, මුවදොර, සයුර
    (2) රජු - මිහිපල්, නරනිඳු, නරේන්ද්‍ර, රාජකීය

07. පහත පදවලට විරුද්ධ පද ලියන්න.
    (1) පුරුදු - ..........................................
    (2) ව්‍යාජ - ..........................................

❀ **පහත පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

"ඉන්දියාව සතු දැවැන්ත කතා සම්භාරය දෙස බලන කල එහි ප්‍රාන්ත රාජ්‍ය කිසිවකට, එම මහා කතා ධාරාවෙන් මුළුමනින් මිදී, ස්වකීය අනන්‍යතාව ගොඩනගා ගැනීමට අසීරු බැව් පෙනේ."

08. මෙහි මහප්‍රාණ අකුරු යෙදී ඇති වචන 02 ක් ලියන්න.
    (1) ......................................... (2) .........................................

09. යංශය යෙදුණු වචන 02 ක් තෝරා ලියන්න.
    (1) ......................................... (2) .........................................

10. ඉහත පාඨයේ ඉරි ඇඳි පදවල අරුත් පිළිවෙළින් නිවැරදිව දක්වා ඇත්තේ කුමන පිළිතුරෙහිද?
    (1) ශක්තිමත්, අපහසු (2) අපහසු, විස්මිත
    (3) විශාල, අපහසු (4) විශාල, අවශ්‍ය

11. පහත යුගල පද සම්පූර්ණ කරන්න.

(1) අතුරු - ....................................

(2) බලි - ....................................

12. පහත ඒක වචන පද බහු වචනයට හරවන්න.

(1) මහල්ලා - ....................................

(2) උපකරණය - ....................................

13. "ලීවෙහු" යන ආඛ්‍යාත පදය සහ "ලීවෙමු" යන ආඛ්‍යාත පදය සඳහා උචිත උක්ත පද **දෙකක්** ලියන්න.

(1) .............................................. (2) ..............................................

❀ **පහත ඡේදය කියවා 14-16 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

"හෙළයේ මහා පඬිරුවන" යනුවෙන් විරුදාවලි ලද කුමාරතුංග මුනිදාස මහතා වියත් ලේඛකයෙකු වූ අතර හෙළ හවුලට ද පුරෝගාමී විය. ළමා සාහිත්‍යය වෙනුවෙන් සුවිශාල සේවයක් ඉටු කළ එතුමා "හෙළ බස සුරකිව්" යනුවෙන් සිය පොතපත තුළින් නිරතුරු පැවසුවේ ය. රටදැය කෙරෙහි ඇල්මෙන් කටයුතු කළ යුතු බව කියා දුන්නේය.

14. 'උගත්', 'පෙරගමන්කරු' යන අරුත් දෙන පද **දෙක** සොයා ලියන්න.

(1) .............................................. (2) ..............................................

15. උපසර්ගයක් මුල්කොට ගත් වචන **දෙකක්** සොයා ලියන්න.

(1) .............................................. (2) ..............................................

16. මෙහි ඉරි ඇඳි අනුක්ත පදයේ උක්ත පදය සහ එහි උක්ත බහුවචන පදය ලියන්න.

උක්ත පදය - ..............................................

උක්ත බහුවචන පදය - ..............................................

17. පහත වාක්‍ය අතීත කාලයට හරවා නැවත ලියන්න.

ඔවුහු ඉතා විශිෂ්ට අයුරින් පරිවර්තන කාර්යයෙහි යෙදෙති.

..............................................................................................

..............................................................................................

18. පහත ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(1) .............................................. ඉන්න බළලා වගේ.

(2) .............................................. කබල්ලෑවා රිංගුවා වගෙයි.

19. පහත පදවල පුරුෂ භේදය නම් කරන්න.

(1) තොපි - ....................................

(2) ඔවුහු - ....................................

20. පහත පදවල අරුත් ලියන්න.

(1) ප්‍රතිචක්‍රීකරණය - ....................................

(3) වහන් සඟළ - .................................... (20 × 2 = 40)

❊❊❊❊❊❊

## II කොටස

❀ **පළමුවන හා දෙවන ප්‍රශ්න ඇතුළු ව තවත් ප්‍රශ්න 3 කට පිළිතුරු සපයන්න.**

(1) සිංහල විෂය සම්බන්ධයෙන් ඔබේ පන්තියේ සිසුන් කණ්ඩායම් වශයෙන් නිර්මාණය කළ කවි සඟරාව ඇසුරින් පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) ඔබ කණ්ඩායම සකස් කරන ලද කාව්‍ය සඟරාවට යෙදූ නම කුමක් ද? (ලකුණු 2)

(ii) සඟරාව සඳහා ඔබ කණ්ඩායම විසින් ඇතුළත් කරන ලද කාව්‍ය නිර්මාණයන්ගේ මාතෘකා තුනක් නම් කරන්න. (ලකුණු 3)

(iii) ඔබ ලියූ රසවත් කාව්‍ය නිර්මාණයට හේතු වූයේ කුමන අත්දැකීමක් ද? (ලකුණු 3)

(iv) මෙම කවි නිර්මාණය කිරීමේදී, ඔබ කියවූ කවි පොත් රචනා කරන ලද කවීන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 2)

(v) සඟරාව නිර්මාණය කිරීමෙන් ඔබ ලැබූ ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 2)

(vi) ඔබ කැමති ලෙස නිර්මාණය කරගත් පද යොදා පහත සඳහන් කවි සම්පූර්ණ කරන්න.

| | |
|---|---|
| ඈත දිලෙනා ළසඳ | බොහෝ දෙනා අතේ තිබෙන |
| වටකුරුයි ............ | ලොකු පොඩි දිග හරි හතරැස් |
| දස අතම එළිය දී | දුරකථනය කියා දෙයක් |
| ........................... | .................................. |

(ලකුණු 4)

(ලකුණු 16)

(2) පහත සඳහන් රචනා මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 200 කට නොඅඩු රචනයක් ලියන්න.

(i) පොත්පත් කියවීමේ වැදගත්කම

(ii) දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම

(iii) අමතක නොවන ශ්‍රීපාද වන්දනාව (ලකුණු 14)

(3) 1. "එවිට රජ කුමරාත් දෑස් රත් කොට <u>දරුණු වූ</u> මුහුණ බලා වෛර බැන්දේ ය. දිසාපාමොක් ආචාරීහු තමන් කෙරේ වෛර බැඳි නියාව දත්හ. දැන දැනත් සියලු ශාස්ත්‍ර උගන්වා <u>නිපුණ කරවූහ.</u>

(i) ඉහත සඳහන් පාඨය අඩංගු කෘතිය ලියූ යුගය කුමක් ද? (ලකුණු 1)

(ii) එම කෘතිය රචනා කරනු ලැබූයේ කාගේ ඉල්ලීමක් මත ද? (ලකුණු 1)

(iii) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න. (ලකුණු 2)

(iv) මෙහි සඳහන් පරිදි රාජ කුමාරයා වෛර බැන්දේ කුමක් හේතුවෙන් ද? (ලකුණු 1)

2. "ළා අඹ දලු නව නවා
දම් පාටින් <u>ඔප දමා</u>
සඳ කැන් <u>මිණි කැට</u> අස්සෙන්
............................ කිමිදිලා"

(i) මෙම කවිය ඇතුළත් පාඩම සඳහන් කරන්න. (ලකුණු 1)

(ii) එහි කතුවරයා කවුරුන් ද? (ලකුණු 1)

(iii) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න. (ලකුණු 2)

(iv) කවියේ හිස්තැන සම්පූර්ණ කරන්න. (ලකුණු 1)

(ලකුණු 10)

(4) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"කරල් පැදුර වාසනාවේ සංකේතයක් හැටියටයි, පුරාණේ පටන් හත් කෝරලයේ වැව් ගම්මානවල ඇත්තන් සලකන්නේ. හොඳින් පැසුණු සරුසාර ගොයම් කරල් අහුරක් තෝරා ගෙන ඒවා ගොයම් බටය පාමුලින් නෙළා ගන්නවා. ඊට පස්සේ මෝස්තර රටා පුරමින් කුඩා පැදුරක් හැටියට වියනවා. ඒ පැදුර අගිස්සේ සාර සුබාවට වැටුණු වී කරල් පිරිලා තියෙනවා. මෙන්න මේ කරල් පැදුර ඇහැ ගැටෙන කාට වුවත් සිතට සතුටක් ඇතිවෙන එක අරුමයක් නොවෙයි. ඒ නිසාම යල - මහ දෙකන්නයේ සරුසාරෙට වැවෙන වී කරල් අහුරක් යොදා ගෙන වැව්ගම්මානවල පොඩොස්සියන් කරල් පැදුරක් දෙකක් වියාගෙන ඒවා ගෝන අංතට්ටුවේ නැතිනම්, ගෙයි දොරකඩ උළුවස්සට ඉහත්තාවෙන් එල්ලා තබනවා. මේ කටයුත්ත නිසා පොඩොස්සියන්ගේ පැදුර විවීමේ දක්ෂ,පක්සකම් හීන් සීරුවට පෙන්වා දෙන අවස්ථාවකුත් වෙනවා. අනික් අතින් මේ වංගියේ, සාර වී අස්වැන්නක් ලැබුණු බවත් එයින් කියැවෙනවා. මේ නිසා කරල් පැදුර වාසනාවේ සංකේතයක් හැටියට සැලකුම් ලබන එක වැව්ගම්මානවල ඇත්තන්ට අමුත්තක් නොවෙයි."

(i) කරල් පැදුර වාසනාවේ සංකේතයක් හැටියට සැලකුවේ කවුද?

(ii) කරල් පැදුර වියන්නේ කුමකින්ද?

(iii) පහත යෙදුම්වල අරුත් ලියන්න.

1. මේ වංගියේ - ........................................................

2. පැදුර අග්ගිස්සේ - ........................................................

(iv) කරල් පැදුර මගින් කියාපාන කරුණු 2 ක් ලියන්න.

(v) මෙහි සඳහන් පරිදි 'වැව්ගම්මානය' යනුවෙන් අදහස් වන්නේ කුමක්දැයි කෙටියෙන් පහදන්න.

(ලකුණු 2×5)

(5) පහත සඳහන් කරුණු ඇසුරින් ආරාධනා පත්‍රයක් සකස් කරන්න.

ස්ථානය - විද්‍යාලයීය ප්‍රධාන ශාලාව
ප්‍රධාන ආරාධිතයා - ගරු අධ්‍යාපන ඇමතිතුමා
දිනය සහ වේලාව - 2016 අගෝස්තු මස 02 දින ප.ව. 2.00 ට
ආරාධනය කාටද? - දෙමාපියන්ට ආරාධනා
කුමක් සඳහා ද? - ශිෂ්‍යත්වලාභීන් සඳහා ත්‍යාග ප්‍රදානෝත්සවය (ලකුණු 10)

(6) පහත සඳහන් වාක්‍යවලට සුදුසු උක්ත පද හා ආඛ්‍යාත පද යොදන්න.

(i) ගංගා තොමෝ සාගරය බලා ....................................

(ii) ........................... සොරා පසුපස ලුහුබඳවා ගියෝ ය.

(iii) ඇළ දොළ ගංගාවලින් ඇතැම් වැව් පෝෂණය ..................................

(iv) ..........................................තම යෙහෙළියන් සමඟ උයනට ගියා ය.

(v) කුරුලු රෑන අහසේ පියාසර ...............................

(vi) ඔවුහු කණ්ඩායම් තරගයෙන් ජය ................................

(vii) සුදු ඇඳුමින් සැරසුණු .................................... පන්සල් යති.

(viii) ........................... මගේ මිතුරාගේ මව බැලීමට රෝහලට යමි.

(ix) මහ නාහිමියෝ නිවේදනයක් නිකුත් ..............................

(x) ගොවියන් ඇටවූ උගුලට නරියා ...................................... (ලකුණු 10)

(7) පහත සඳහන් ප්‍රහේලිකාව පුරවන්න.

| | | | | | |
|---|---|---|---|---|---|
| 1 | 2 | 5 ය | | 6 | 7 ය |
| | | | ■ | | |
| 3 | | ස | ■ | 8 | |
| 4 | | ■ | 9 | ම | ■ |

The National e-learning Portal for The General Education

**හරහට**

1 ලෝහ කම්හල් පැවති බවට සාධක හමු වූ ආරාමයකි.
3 'දිනය' යන අරුත දේ
4 පැහැයකි
8 වෘක්ෂ
9 කෙනෙක්, දෙයක්, ස්ථානයක් ආදිය හැඳින්වීම සඳහා යොදන පද මේ නමින් හැඳින් වේ.

**පහළට**

1 'ආදර' යන පදයෙහි විරුද්ධ පදය
2 'බුදු හිමි' යන පදයට සමාන පදයකි.
5 'කීර්තිය' යන අරුත දේ
6 ලෝහ වර්ගයක් සඳහා ප්‍රසිද්ධ වූ ගමක නමකි
7 යකඩ කර්මාන්තය හා බැඳි පදයකි (ලකුණු 10)